# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,898 — 1970 මාර්තු 20 වැනි සිකුරාද — 1970.3.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 399 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 406 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| සිරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 417 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 418 | විවිධ දැන්වීම ... ... ... ... | 419 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමන ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත් වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියය 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වනන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---


399—බී 69664—15,521 (70/3)

(ඩී) 1970 අප්‍රේල් මස 10 වැනිදාට තමාගේ වයස අවුරුදු විසි දෙකකට නොඅඩු බව හා අවුරුදු තිස්පහට නොවැඩි බව. (රජයේ සේවයේ තනතුරු දරන්නන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඊ) ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, සංඛ්‍යාලේඛන විද්‍යාව, ගණිතය, භූගෝල විද්‍යාව, කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව හෝ සමාජවේදය පිළිබඳ පළවෙනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් ලැබූ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් හෝ ඉහත සඳහන් විෂයකින් පශ්චාත් උපාධියක් ලැබූවෙක් බව.

සටහන.—ක්‍රම සම්පාදන සේවක සංඛ්‍යාවේ නිලධාරියකු වශයෙන් සේවය කිරීමට අවශ්‍ය නිපුනත්වය ලබා ගැනීම සඳහා යෝග්‍ය පරිදි පුහුණු වීමට යම් අයදුම්කරුවකු කැමැත්තේ නම්, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හෝ වෙනත් විද්‍යා විෂයකින් පළමුවැනි පන්තියේ හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් ද, එසේ නැත්නම් කලා හෝ විද්‍යා අංශයේ පළමුවැනි පන්තියේ උපාධියක් ද සුදුසුකම ලෙස සලගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 13 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

**3–436—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය**

---

## කිරි මණ්ඩලය

කිරි මණ්ඩලීය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත්, පහත සඳහන් අයුරු සකස්කර 1970 මාර්තු 31 දින හෝ ඊට පෙර පහත සඳහන් අයවෙත ලැබෙන සේ එවිය යුතුය.

**ප්‍රධාන අභ්‍යන්තර ගණන් පරීක්ෂණ සහකාර—V වැනි ශ්‍රේණිය**

වැටුප.—රු. 600—8 × 25—800 මසකට (සියලු දීමනා සහිතව).

තෝරාගනු ලබන අයදුම්කරු, ලබා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද මත මෙම වැටුප් පරිමානයේ සුදුසු පියවරක තැබිය හැකි වේ.

**සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත දක්වෙන කරුණු වෙනුවෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙකු බව.

(ii) 1970 මාර්තු 31 දිනට අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(iii) හොඳ කල්ක්‍රියාවෙන් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව.

(iv) සම්මාන 4 ක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සම්මාන 4 ක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ විෂයයන් 6 කින් සමත් වී සිටීම.

සහ

(v) පිළිගත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ වෙළඳ ආයතනයක ගණන් පරීක්ෂා කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් දස අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර ගණන් පරීක්ෂණ සහකාරවරු—VI වැනි ශ්‍රේණිය**

වැටුප.—රු. 325—14 × 15/2 × 20—575 මසකට (සියලු දීමනා සහිතව).

තෝරාගනු ලබන අයදුම්කරුවන් ලබා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද මත මෙම වැටුප් පරිමාණයේ සුදුසු පියවරක තැබිය හැකි වේ.

**සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත දක්වෙන කරුණු වෙනුවෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙකු බව.

(ii) 1970 මාර්තු 31 දිනට අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(iii) හොඳ කල්ක්‍රියාවෙන් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව.

(iv) සම්මාන 4 ක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සම්මාන 4 ක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ විෂයයන් 6 කින් සමත්වී සිටීම.

සහ

(v) පිළිගත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ වෙළඳ ආයතනයක ගණන් පරීක්ෂා කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් පස් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර ගණන් පරීක්ෂණ සහකාරවරු—VII වැනි ශ්‍රේණිය**

වැටුප.—රු. 250—20 × 10—450 මසකට (සියළු දීමනා සහිතව).

තෝරාගනු ලබන අයදුම්කරුවන්, ලබා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද මත මෙම වැටුප් පරිමානයේ සුදුසු පියවරක තැබිය හැකි වේ.

**සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත දැක්වෙන කරුණු වෙනුවෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙකු බව.

(ii) 1970 මාර්තු 31 දිනට අවුරුදු 20 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(iii) හොඳ කල්ක්‍රියාවෙන් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව.

(iv) සම්මාන 4 ක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සම්මාන 4 ක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ විෂයයන් 6 කින් සමත් වී සිටීම.

සහ

(v) පිළිගත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ වෙළඳ ආයතනයක ගණන් පරීක්ෂා කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් තුන් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

2. **සේවා කොන්දේසි.**—

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම භාරගැනීමට මත්තෙන් රාජ්‍ය සේවයේ ස්වකීය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය උඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හල හොත්, මණ්ඩලයට බැඳුණු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 18 (අ) ඡේදය යටතේ ඔහුට හිමි වී තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව සිය නිලධාරියා සේවයෙන් මුදවාලිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවනතුරු, මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට මත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවන්ටත් මතුවට පනවන නීතිරීති හා ව්‍යවස්ථාවන්ටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසියකට අයදුම්කරු යටත් විය යුතුය.

(ඈ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවතින්නේ වෙනත් කරුණු සමග රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර තනතුරු වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සන් වේ.

4. **ඇප.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ඇප තැබීම අවශ්‍ය විය හැක.

5. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලැබුවන් මණ්ඩලයේ වෛද්‍ය නිලධාරි විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ.

6. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත්වලට අමුණා තිබිය යුතුය:

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කායශීයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය)

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, ඉන් එකක් විදුහල්පතිගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ සහ දැනට සේවය කරන ආයතනයන්හි ඉටුකරන ලද සහ ඉටුකරනු ලබන වැඩ හඳුන්වන සහතික.

7. රජයේ සේවයේ සහ සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු සහ සංස්ථා ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු වේ.

8. අයදුම්පත් හා ඊට සම්බන්ධ අනිකුත් ලියකියවිලි කිරි මණ්ඩලයේ සභාපති වෙත හැර මණ්ඩලීය සේවයේ අන් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුය.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

## කිරි මණ්ඩලය

### අයදුම්පත

1. තනතුර :————.

2. සම්පූර්ණ නම :————.

3. පෞද්ගලික ලිපිනය :————.

4. ජාතිය :————.

5. අයදුම්කරු උපන් දිනය, ස්ථානය සහ වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

6. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

7. ලබා ඇති ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

8. සිංහල සහ/හෝ දෙමළ පිළිබඳ දැනුම :————.

9. දැනට කරන රැකියාව පිළිබඳ විස්තර :————.

10. කලින් ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–281—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### මිනින්දෝරු තනතුරක් (අනියම්)

කතරගම සංරක්ෂණ යෝජනාක්‍රමයේ වැඩ සම්බන්ධයෙන් අනියම් පදනම මත, මිනින්දෝරු තනතුරක් සඳහා අයදුම්පත් භාර ගනු ලැබේ.

මතු දැක්වෙන ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර, 1970 අප්‍රේල් මස 9 වෙනි දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප්.**—මෙම තනතුර සඳහා වර්ෂයකට රු. 4,152 ක ඒකාබද්ධ (ස්ථිර) වැටුපක් නියමිතය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම තමා පිළිබඳ මතු සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) 1970 අප්‍රේල් මස 9 වෙනි දිනට තමාගේ වයස අවුරුදු 45 ට නොවැඩි බව, මනා චරිතයක් ඇති බව සහ යහපත් කායික සෞඛ්‍යයෙන් යුත් බව,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ මැණීම් සහ මට්ටම් කිරීම පිළිබඳ පාඨමාලාව හෝ ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා වූ පාඨමාලාව හෝ සාර්ථක ලෙස අවසන් කළ බව හෝ වෙනත් ඒ හා සමාන පරීක්ෂණයකින් සමාර්ථ වූ බව.

4. උවමනා වූ විටෙක, සෑම අයදුම්කරුවෙකු විසින් ම, මතු දැක්වෙන ලියවිලිවලින් එකක් හෝ ඒ සියල්ලම හෝ ඉදිරිපත් කිරීම අවශ්‍යය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කායශීයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ භාර නොගන්නා බැව් සැළකිය යුතුය).

(ආ) තමා ලබා ඇති උසස් ම අධ්‍යාපන සහතිකය.

(ඉ) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) තමාගේ කල්ක්‍රියාව පිළිබඳව මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) ඡේදයේ මුලින් පළ කොට ඇති පොදු සේවා තනතුරු අපේක්‍ෂකයින් සඳහා වූ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

ඩබ්ලිව්. පද්මනාදන්,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
ආයතන හා ගිණුම්.

පළාත් පාලන අමාත්‍යාංශයේ,
නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
1970 මාර්තු මස 10 වෙනි දින.

**පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය**

## අනියම් මිනින්දෝරු තනතුර පිළිබඳ වූ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.

4. ජාතිය :————.

5. දැනට රක්ෂාව කරයි නම් එය :————.

6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිම වරට කළ රක්ෂාව : ————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. කාර්මික සුදුසුකම් :————.
(සමර්ථ වූ විභාගය සඳහන් කරන්න.)

9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.

10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.

11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.

12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත්නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තරය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

3–387—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදව

### වෛද්‍ය නිලධාරියකු සඳහා පුරප්පාඩු

1. රාජකීය ලංකා නාවික හමුදවේ වෛද්‍ය නිලධාරියෙකුගේ තනතුරක් සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා ගන්නා ලද අපේක්ෂකයාට වෛද්‍ය ලුතිනන්වරයෙකු වශයෙන් රාජකීය ලංකා නාවික හමුදවේ නිත්‍ය නාවික බලකායේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

3. (අ) **වැටුප්.**—වෛද්‍ය නිලධාරියෙකුගේ වැටුප් පරිමාණය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන්ට අදළ පරිමාණයන් වේ.

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ඇත :—

(i) **සේවා දීමනා.**—ලුතිනන් සහ ලුතිනන් කොමාන්ඩර්වරයෙකුට මසකට රු. 180 බැගින්.
කොමාන්ඩර්වරයෙකුට මසකට රු. 225 බැගින්.

(ii) රජයේ වෛද්‍ය නිලධාරීන්ට අදළ වන අයුරින්ම විශ්‍රාම වැටුප් රහිත දීමනා සමාන සුදුසුකම් ඇති අයට ගෙවනු ලැබේ.

(iii) නාවික හමුද වැටුප් සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා ඇති අයුරින් සුදුසුකම් වැටුප් ගෙවනු ලැබේ.

(iv) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ :—

පළමුවෙන්ම සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා රු. 650කි. මීට අතිරේක වශයෙන් අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් නඩත්තු දීමනාව වශයෙන් මසකට රු. 25ක මුදලක් ගෙවනු ලැබේ.

4. තෝරා ගන්නා ලද අපේක්ෂකයා විවාහකයෙක් නම්, විවාහක නිවාසයක් (ලබා දිය හැකිනම්) සහ අනුගාමික සේවය සඳහා මසකට රු. 75ක දීමනාවකටද හිමිකරුවකු වේ. අවිවාහක නම් සේවක සේවයද සහිතව නිලධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබීමට සුදුස්සෙක් වේ.

5. තෝරා ගන්නා ලද අපේක්ෂකයාට කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කර සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 වැනි දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහයේ සටහන් සහ කොන්දේසි යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් හිමි වේ. සේවා කොන්දේසි, උසස්වීම් ආදිය ගැන වැඩිදුර විස්තර කොළඹ, නාවික හමුද මූලස්ථානයෙන් ලබාගත හැකි වේ.

6. අයැදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) **ජාතිය.**—අයැදුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) **වයස.**—අයැදුම්කරුවන් 1970 අප්‍රේල් 20 දිනට වයස අවුරුදු 30 ට වැඩි නොවිය යුතුයි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—අයැදුම්කරුවන් ඖෂධ සහ ශල්‍ය වෛද්‍ය පිළිබඳ උපාධිධරයෙකු හෝ උසස් සුදුසුකම් ඇත්තෙකු විය යුතු අතර වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා, ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූවෙකු විය යුතුද, ලියාපදිංචි කළ දින සිට අවුරුදු 2ක් සේවයේ යෙදී සිටිය යුතුද වේ.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයැදුම්කරුවන් නාවික හමුදවේ නියම කර ඇති පරිදි සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතුයි. පත්වීම ලැබීමට මත්තෙන් නාවික හමුදව විසින් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

7. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව අයැදුම් පත් අත් අකුරින් ලියා 1970 අප්‍රේල් 20 වැනි දිනට පෙර නාවික හමුදාධිපති, නාවික හමුද මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ, වෙත එවිය යුතුයි. අයැදුම් පත බහා එවන කවරයේ " වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයැදුම් පත " යනුවෙන් සඳහන් කළ යුතුයි. අයැදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ.

8. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන අයැදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. තෝරා ගනු ලැබුවහොත් එම නිලධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක්ද එහි තිබිය යුතුයි.

9. අයැදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකය සහ දැරූ තනතුරු පිළිබඳ සහතික,

(ඇ) අයැදුම්කරු පෞද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින්ගෙන් ලබාගත් යටත්පිරිසෙයින් චරිත සහතික දෙකක්.

10. ලැබෙන අයැදුම් පත් ගණන අනුව අවශ්‍ය වූවහොත්, ප්‍රථමයෙන් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය.

11. සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබූ අයැදුම්කරුවන්ට, සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පවත්වනවා ඇත. මේ සඳහා අයැදුම්කරුවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් අන්දමේ වියදම් සඳහා ලංකාණ්ඩුවෙන් මුදල් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු නොලබන අයැදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

12. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

ආර්. කදිර්ගාමර්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

රාජකීය ලංකා නාවික හමුදව,
තැ.පෙ. 593,
කොළඹ, 1970 මාර්තු මස 10 වැනි දින.

## රාජකීය ලංකා නාවික හමුදාව

### වෛද්‍ය නිලධාරි සඳහා අයැදුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ජාතිය (ලංකාවේ පුරවැසියකු නම්, උත්පත්තියෙන්ද නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන්ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සහ දිනය සඳහන් කරන්න) :——.

3. ලිපිනය—

රාජකාරි :————.

පෞද්ගලික :————.

4. උපන් දිනය :————.

5. පහත සඳහන් පරිදි මව්පියන්ගේ විස්තර :—

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

6. විවාහකද අවිවාහකද යන වග :————.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී හෝ ඔබ ලබා ඇති ක්‍රීඩා පිළිබඳ දක්ෂකම් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී හෝ ලබාගත් විශේෂ සුදුසුකම් :————.

9. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ සංවිධානයක සේවය කර තිබේද ? :————

10. මෙම තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

11. මීට පෙර සන්නද්ධ සේවාවක පුරප්පාඩුවක් සඳහා ඉල්ලුම් කර තිබේද ? :————.

එසේ නම් එහි ප්‍රතිඵලය :————.

12. ඔබේ පාසැලේදී සහ විශ්ව විද්‍යාලයේ හෝ චරියාව පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :————.

| පාසැලේ සහ විශ්ව විද්‍යාලයේ නම | දිනය | | සමර්පවූ ආණ්ඩුවේ පරීක්ෂණය |
|---|---|---|---|
| | ඇතුළත්වීම | පිටවීම | |
| | | | |

13. විශ්ව විද්‍යාලය හැර යාමෙන් පසුව නියුක්තව සිටි රැකියාවල් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවෙහි ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

14. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–337—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### IIවන පෙළ සැලසුම්කරු තනතුර

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ II පෙළ සැලසුම්කරු තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. යට දැක්වෙන ආදර්ශ ආකෘතියේ පරිදි පිළියෙල කරන අයදුම්පත් 1970 අප්‍රේල් මස 20 වන දින හෝ ඊට ප්‍රථම කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

2. **අවශ්‍ය සුදුසුකම් :**

(ඒ) **වයස.**—1970.4.20 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි වීම.

සහ

(බී) **අධ්‍යාපනික.**—ගණිතය විෂයයක්ව ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව විෂයයන් ද ඇතුලත්ව දෙවරකට නොවැඩි වාර ගණන කදී පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ විෂයයන් හය කින් සමත් වීම.

සහ

(සී) **කාර්මික.**— පහත දැක්වෙන සුදුසුකම් වලින් එකක් තිබීම :—

(i) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මානය පිළිබඳ තුන් අවුරුදු සන්ධ්‍යා හෝ අර්ධකාල පාඨමාලාවේ I කොටස, II කොටස, III කොටස ආදී වශයෙන් සියළුම කොටස් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ ආධුනික සැලසුම්කරුවකු වශයෙන් පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ වරලත් ඉංජිනේරු හෝ ගෘහ නිර්මාන ශිල්පීන් යටතේ හතර අවුරුදු අඛණ්ඩ සේවා කාලයක් තිබීම. (මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයින් යට දැක්වෙන වැටුප් ක්‍රමයේ රුපියල් 3,864 ඒකාබද්ධ වාර්ෂික වැටුපට නොවැඩි වැටුප් තලයකට පත් කිරීම සලකා බලනු ලැබේ.)

හෝ

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ පාඨමාලාවේ II වන කොටස 1947 වර්ෂයට පෙර සමත් වී තිබීම සහ අවුරුදු 2 කට වැඩි කාලයක් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සැලසුම්කරුවකු වශයෙන් සේවය කර තිබීම.

හෝ

(iii) පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ වරලත් ඉංජිනේරු හෝ ගෘහ නිර්මාන ශිල්පීන් යටතේ සැලසුම් කරුවකු වශයෙන් පස් අවුරුදු සේවා කාලයක් තිබීම,

හෝ

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ පූර්ණකාල එක් අවුරුදු සැලසුම් කරු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ ආධුනික සැලසුම්කරුවකු වශයෙන් දෑවුරුද්දක සේවා කාලයක් තිබීම,

හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලක වරුන්ගේ පාඨමාලාව හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ ආධුනිකයෙකු වශයෙන් අවුරුද්දක සේවාකාලයක් තිබීම.

3. **වැටුප් ක්‍රමය.**—තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය රුපියල් 3,432—144×21—රුපියල් 6,456 වන අතර මෙම වැටුප් ක්‍රමයේ රුපියල් 5,304 වැටුප් තලයට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි.

4. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති සහ කොන්දේසි.—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම පළමුවෙන් තුන් අවුරුදු අඩුතික කාලසීමාවකට යටත් වන්නේ ය.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, තෝරාගතහොත් ඔවුන් දැනට දරණ තනතුරුවලින් මුදාලිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සටහනක් ඇති අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

7. අයදුම්කරුවෝ තම අයදුම්පත්වලට පහත දැක්වෙන සහතිකයන්හි පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුත්තාහ :—

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතිකය,

(iii) දැන්වීමේ 2 (සී) ඡේදයේ සඳහන් කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතික,

(iv) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.).

8. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අමරදාස ගුණවර්ධන,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 මාර්තු 10 වන දින.

### ආදර්ශ අයදුම් පත්‍රය

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### II පෙළ සැලසුම්කරු තනතුර

1. සම්පූර්ණ නම :————.
   පෙළපත් නාමය :————.
   අනික් නාමයන් :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. 1970.4.20 දිනට වයස :————.
5. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
6. අධ්‍යාපන සුදුසුකම්—සමත් වූ ප්‍රසිද්ධ විභාගයන්ගේ දිනයන් සහ විෂයයන් සහිතව :————.
   (සහතිකපත්හි පිටපතක් ඇමිණිය යුතුය.)
7. දැන්වීමේ 2 (සී) ඡේදය යටතේ ඔබ සතු කාර්මික සුදුසුකම් කවරේද ? :—
   (සහතිකපත්හි පිටපත් අමුණන්න.)
   (i) කාර්මික සුදුසුකම් :————.
   (ii) පළපුරුද්ද :————.
8. චරිත සහතික ලබාගන්නා ලද්දවුන්ගේ ලිපිනයන් :————.
   (සහතිකපත්හි පිටපත් ඇමිණිය යුතුය.)
9. දැනට කරන රක්ෂාව සහ වැටුප :————.
10. විශේෂ සුදුසුකමක් ඇතොත් සඳහන් කරන්න :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත්, මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බැව් හා පත්වීමෙන් පසු අසත්‍යතාවයක් ඔප්පුවුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතු වන බැව් හොඳාකාර මම දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

3–319—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ගුණානන්ද මාවත 'ඒ' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධූරය

කොළඹ 13, ශ්‍රී ගුණානන්ද මාවත උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපති ධූරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අඩුම මාසික දීමනාව රු. 75 කි.

1. 1970. 4. 30 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයන් විය යුතුයි.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සහා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සහා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී තිබිය යුතුයි.

4. ශ්‍රී ගුණානන්ද මාවත උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

5. කොළඹ 1, ඇච්ලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ඉල්ලුම්පත් සඳහා මුද්‍රිත ෆෝර්ම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 1970. 4. 30 වැනි දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රාදේශීය තැපැල් අධිකාරී තුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට් මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

3–390—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

### පුස්තකාල සහකාර තනතුර

බැංකු සේවයේ V ශ්‍රේණියේ පුස්තකාල සහකාර තනතුරක් සඳහා අයැදුම්පත් කැඳවේ. අයැදුම්පත්, කොළඹ 2, යුනියන් පෙදෙසේ මාටිනස් සී. පෙරේරා ගොඩනැගිල්ලේ අංක 167-1/1 හි මහජන බැංකුවේ සේවක කළමනාකාර තැනගෙන් ලබාගත යුතු මුද්‍රිත ආකෘතියන්හි විය යුතු අතර, 1970.4.15 දින නොහොත් ඊට පෙර සේවක කළමනාකාර තැන වෙත ලැබිය යුතු ය. අයැදුම් පත් තැපැලෙන් එවනුයේ ලිපිනය ලියූ මුද්දර ගැසූ ලිපි කවරයක් එවුවහොත් පමණකි.

(අ) වැටුප සහ දීමනා.—

(i) වැටුප් පරිමාණය : $\frac{\text{රු. 212 සිට රු. 435}}{10\times10,\ 2\times12,\ 1\times14,\ 5\times15.}$

(ii) බැංකු පරිමාවන් අනුව ජීවන වියදම් සහ විශේෂ ජීවනාධාර දීමනා.

(iii) රු. 25 ක අන්තර දීමනාවක්.

(ආ) සුදුසුකම්.—

(i) වයස—අයැදුම්කරුවන් 1970 අප්‍රේල් 15 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.

(iii) ජාතිය—අයැදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(iii) අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් :—

(අ) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම, අයැදුම්කරුවන් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේදී නැත්නම් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේදී හෝ ඊට උසස් විභාගයකදී හෝ සිංහල හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) ලංකා පුස්තකාල සංගමයේ හෝ එංගලන්තයේ පුස්තකාල සංගමයේ හෝ මූලික පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

(ඈ) පුස්තකාලීය කටයුතු සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 2 ක සේවා පළපුරුද්ද.

(ඇ) ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් යතුරු ලියනය කිරීමට හැකියාවක් සහ ලඝුලේඛනය පිළිබඳ දැනුමක් තිබීම අමතර සුදුසුකමක් වේ.

(ඇ) අයදුම්කරුවන්, අයදුම් පතට මෙම සහතිකයන් හි පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.

**සටහන.**—පාඨශාලීය නොහොත් අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කැරෙන විශේෂ උප්පැන්න සහතිකය භාර ගනු නොලැබේ.

(ii) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

**සටහන.**—

(අ) විභාග කොමසාරිස් තැන විසින් නිකුත් කැරුණු සහතිකපත් ඇති කල එම සහතිකයන් හි පිටපත් ඇමිණිය යුතුය.

(ආ) විභාග කොමසාරිස් තැන විසින් නිකුත් කැරුණු සහතිකපත් නොමැති කල, අයදුම්කරුගේ විභාගාංක, විභාගයන් පැවැත්වුණු දිනයන්, සමත් වූ විෂයයන් සහ ඒ ඒ විෂයයෙන් ලබාගත් ශ්‍රේණී දැක්වෙන, විදුහල්පතිවරුන් විසින් නිකුත් කැරුණු සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(iii) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය සම්බන්ධයෙන් මෑතකදී ලබාගත් සහතික තුනක්.

(ඈ) **සේවා කොන්දේසි.**—තෝරා ගැණුනු අපේක්ෂකයා විසින්,

(i) පත්වීම ලබාගැනීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීම.

(ii) අවුරුද්දක ආධුනික කාලයකට යටත්ව සේවය කොට, සේවයෙහි ස්ථිර කරනු ලැබීමට පෙර ලංකා පුස්තකාල සංගමයේ හෝ එංගලන්තයේ පුස්තකාල සංගමයේ හෝ මධ්‍ය පරීක්ෂණය සමත් වීම.

(iii) බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයනට බැඳීම.

(iv) දිවයිනෙහි ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යවේ.

(ඉ) **ඇපය.**—තෝරා ගැණුනු අපේක්ෂකයා විසින් මුදලින් රු. 500 ක ඇපයක් තැන්පත් කළයුතු වේ.

**පොදු.**—කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අපේක්ෂකයන්ගෙන් අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අන් කිසිදු වියදමක් හෝ බැංකුව මගින් ගෙවනු නොලැබේ.

තම ඉල්ලුම්පත් ලේඛනගත තැපෑලෙන් එවන මෙන් අපේක්ෂකයිනට උපදෙස් දෙමු. තම අයදුම් පත් අප වෙත ලත් බැව් දැනුම් දෙනු ලැබීමට පිසි අයදුම්කරුවන් තම අයදුම් පත් සමග ලිපිනය ලියූ මුද්දර ගැසූ ලිපි කවරයක් එවිය යුතුය.

අයදුම් පත් "V ශ්‍රේණියේ පුස්තකාල සහකාර තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් ලිපි කවරයෙහි වම් උඩු කෙළවරෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනුයේ තනතුර සඳහා මැනවින්ම සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් පමණි.

මෙම තනතුර සඳහා පත්කරගනු ලැබූ අපේක්ෂකයාට බැංකු ව්‍යාපාරික අංශයට මාරුවීම සඳහා සුදුසුකම් කිව නොහැක.

සේවක කළමනාකාර තැන.

මහජන බැංකුව,
යූනියන් පෙදෙස, කොළඹ 2, 1970 මාර්තු 12.

**3–421—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය**

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව

**එල්. 312/42 වර්ගයේ "වාටා බෙන්ස්" ට්‍රක් වැසි තුනකට පියැදුරු කාමර සහිත හමුදා පාවිච්චියට සුදුසු බඩු ගෙන යා හැකි බොඩි නිෂ්පාදනය කිරීම සහ සවිකිරීමේ ටෙන්ඩරය**

1970 පෙබරවාරි මස 20 වැනි දින අංක 14,894 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ දැන්වීම සම්බන්ධවයි. ඉහත සඳහන් ටෙන්ඩරය සඳහා ටෙන්ඩර්පත් භාර ගැනීම 1970 අප්‍රේල් මස 2 වැනි දින පෙරවරු 10 තෙක් දීර්ඝ කර ඇත. 1970 අප්‍රේල් මස 1 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාපති.

**– 388—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය**

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

රාජකීය ලංකා ගුවන් හමුදාවේ කටුනායක පිහිටා තිබෙන අංක 115, 244, 191, 258, 260 හා 130 දරණ ගොඩනැගිලිවල වහලවල් අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1970 අප්‍රේල් මස 10 වෙනි සිකුරාදා පෙරවරු 10 දක්වා කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

2. කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ප්‍රධාන වැඩ නිලධාරීන්ගෙන් ලබා ගන්නා ආකෘති පත්‍රවල පිටපත් දෙකක් සහිතව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. අවශ්‍ය විස්තර එතුමාගෙන් ලබාගත හැක. 1970 අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. අත්සන් කර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු ටෙන්ඩර් සීල් තබා, "රාජකීය ලංකා ගුවන හමුදාවට අයත් කටුනායක පිහිටා තිබෙන ගොඩනැගිලි හයක වහලවල් අළුත්වැඩියා කිරීම පිළිබඳ ටෙන්ඩර්" යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරෙහි ලියා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, රාජකීය ලංකා ගුවන් හමුදාව, තැ. පෙ. 594, කොළඹ" යන ලිපිනයට එවිය යුතුය.

3. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරන්නා වූද රු. 1,50,000කට නොඅඩු රජයේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින ටෙන්ඩර්කරුවන් පමණක් ටෙන්ඩර් එවීමට සුදුස්සෝ වෙති :—

(අ) ලියාපදිංචිවීම ඔප්පු කිරීමට ලියවිලි සහ,

(ආ) ආපසු ලබාගත හැකි රු. 200ක තැන්පත් ටෙන්ඩර් මුදලක් සඳහා සහ ආපසු ලබාගත නොහැකි රු. 5ක ටෙන්ඩර් ගාස්තුවක් සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ විට.

4. පහත සඳහන් අය ආපසු ගෙවන තැන්පත් මුදලෙන් නිදහස් වෙති :—

(අ) සමූපකාර තොග ගබඩා ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවල රජයේ වානිජ සංස්ථා.
උදාහරණ වශයෙන් : චීනයේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සංස්ථාව.

(ඉ) සමූපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් ග්‍රාම සංවර්ධන සමිති.

(ඊ) සමූපකාර සමිතිවල රෙජිස්ට්‍රාර් තැන විසින් පිළිගත් සමූපකාර සමිති.

5. ටෙන්ඩර් තැන්පත් මුදල හා ටෙන්ඩර් ගාස්තුව කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී තැනට ගෙවිය යුතුය.

ඇම්. ඇස්. මාරූප්,
බලගත නායක,
ගුවන් හමුදාධිපති වෙනුවට.

**3–338—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය**

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

මෙහි පහත සඳහන් ද්‍රව්‍යයන්, වාලච්චේනයෙහි නැගෙනහිර කඩදාසි කම්හලට සැපයීම සඳහා ටැන්ඩර් කැඳවේ:—

1. බ්ලීච්ඩ් ක්‍රාෆ්ට් (සල්ෆේට්) පල්ප
   අවසාන දිනය: 1970.6.16. —දිගටොන් 1,200 ක්.
2. බ්ලීච්ඩ් සල්ෆයිට් පල්ප
   අවසාන දිනය: 1970.5.30. —දිගටොන් 1,400 ක්.
3. සෝඩා ඈෂ්
   අවසාන දිනය: 1970.5.23 , —දිගටොන් 2,000 ක්.
4. ෆෝර්ටිෆයිඩ් රෝසින් සයිස්
   අවසාන දිනය: 1970.6.10. —දිගටොන් 100 ක්.

මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් දක්වමින් අයැදි විට ටෙන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර ලබාගත හැක.

ති. බ. නාරම්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

1970 මාර්තු 3 වෙනි දිනදී,
කොළඹ 2 හි,
යූනියන් පෙදෙසේ අංක 356 හි දීය.

3–426—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මොරවැව ව්‍යාපාරයේ ජනපද නිලධාරි නිවාස ආදිය තැනීම**

ඉහත සඳහන් ව්‍යාපාරයෙහි මතු දැක්වෙන ගොඩනැගිලි ආදිය තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1970.4.24 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| ජනපද නිලධාරි නිවාස | ... | ... 1 යි |
| ජනපද නිලධාරි කාර්යාලය | ... | ... 1 යි |
| කාර්යාධිකාරි නිවාස | ... | ... 1 යි |
| ළිං ... | ... | ... 1 යි |

2. 1970.4.22 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මොරවැව ව්‍යාපාරයේ ජනපද නිලධාරි නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට නව (9) මසක් ඇතුළත වැඩය නිමකළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1970.4.24 දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අඩුම වශයෙන් රු. 50,000 කට රෙජිස්ටර් වූවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී එම රෙජිස්ටර් වීම ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දේවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් බාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ටී. එස්. සුප්‍රමානියම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ 70.3.12
සීටී/2/408

3–389—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

**පළිගුවක් හෝ කෘතිම පළිගුවක් සපයා මිහින්තලේ මහාසෑයේ පිත්තල කොතට සවිකිරීම**

1970.2.20 වැනි දින ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම අනුව ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1970 අප්‍රේල් මස 4 වැනි දින පස්වරු 3 දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි. 1970 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය.

ආර්. එච්. ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

ඈස්. ඈස්. 526,
1970 මාර්තු මස 12 වැනි දින,
කොළඹ 7, සර් මාකස් ප්‍රනාන්දු මාවතේ
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදීය.

3–405—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**මහවැලි යෝජනා ක්‍රමය**

මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමයේ 1 වන පියවරේ, 1 වන ව්‍යාපාරය යටතේ පොල්ගොල්ලේ උමං පිවිසුම අසලදී, කටුගස්තොට-මඩවල මහා මාර්ගය හැරවීමේ වැඩ කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 50,000කට හා ඊට වැඩි කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ 70. 4. 7 දින පෙරවරු 10 දක්වා පොල්ගොල්ලේ මහවැලි යෝජනා ක්‍රමයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

2. අඩුම වශයෙන් පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර හිමි අයවලුන් පමණක් මේ සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් සුදුසු වන අය වන අතර, ඒ බව සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් සනාථ කළ යුතුය.

(1) 1 වන පන්තියේ ට්‍රැක්ටරයක්.
(2) 2 වන පන්තියේ ට්‍රැක්ටර් 2ක්.
(3) මෝටර්රයිස්ඩ් ස්ක්‍රේපර් 3ක්.
(4) පස් තලන "ෂීප් ෆුට්" රෝලර් 1ක්.
(5) වතුර බව්සරයක්.
(6) ලොරි 2ක්.

3. ටෙන්ඩර්පත් පිටපත් තුනකින් විය යුතු අතර, ඒවා 1970. 3. 31 සිට 70. 4. 5 වෙනි දින දක්වා කාර්යාල වේලාවන්

තුළදී පොල්ගොල්ල, උකුවෙළ සහ බෝවතැන්නේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායර්‍යාල වලින් ලබාගත හැක.

4. ටෙන්ඩර් අයදුම්පත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට මෙම දෙපාර්තමේන්තුවේ කරණ වැඩවල ප්‍රගතිය දැක්වෙන ප්‍රකාශනයක්ද ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉදිරිපත් කිරීමට ප්‍රථම රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක්ද වාරිමාර්ග කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙම ටෙන්ඩරය සම්බන්ධ වැඩි විස්තර පොල්ගොල්ලේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබා ගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මහවැලි යෝජනා ක්‍රමය.

1970. 3. 3 දින,
පොල්ගොල්ලේ වාරිමාර්ග කායර්‍යාලයේ දීය.

3–380—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කොළඹ උප කොටස

කොළඹ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1970 අප්‍රේල් මස 8 වන බදාද පෙරවරු 11 දක්වා ජාවත්ත පාරේ, කොළඹ 5, බස්නාහිර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩය ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචිවූ ගණන<br>රු. | ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. |
|---|---|---|
| කැලණි උතුරු බැම්ම අළුත්වැඩියා කිරීම | 40,000 ... | 50 |

3. 1970 අප්‍රේල් මස 5 වෙනිදා දක්වා කායර්‍යාල වේලාවන් තුළදී කොළඹ/කළුතර/ගම්පහ/රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායර්‍යාල යන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර එම වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කායර්‍යාලවලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් 1970 අප්‍රේල් මස 5 වෙනි දින හෝ ඊට පෙර කායර්‍යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය හා කායර්‍යාල වේලාවන් තුළදී කොළඹ වාරිමාර්ග කායර්‍යාලයෙන් ලබාගත හැක.

අයි. එච්. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු, කොළඹ උප කොටස.

වාරිමාර්ග කායර්‍යාලය,
ජාවත්ත පාර, කොළඹ 5,
1970 මාර්තු මස 11 වැනි දින.

3–345—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මධ්‍යම කොට්ඨාශය භාර නත්තරන්පොත කුණ්ඩසාලේ වාසී ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1970 අප්‍රේල් මස 15 වෙනි බදාදා දින පෙරවරු 10.00 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

| වැඩ විස්තර | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල<br>රු. | ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. |
|---|---|---|
| (1) දුන්නබිඳුන වැව ප්‍රතිසංස්කරණය කිරීම (වැ බැම්මේ කැලය එළි කිරීම සහ පස්වැඩ පමණි) | ... 45,000.00 ... | 50.00 |
| (2) වැවතැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම (ප්‍රවේශ පාර, වාන සහ හොරොව්ව පමණි) | ... 22,000.00 ... | 25.00 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

1970 අප්‍රේල් මස 1 වෙනි දින සිට 1970 අප්‍රේල් මස 12 වෙනි දින දක්වා සාමාන්‍ය කායර්‍යාලීය වේලාවන්හි දී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු කායර්‍යාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැතිද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. අංක 1 සඳහා වූ වැඩය යන්ත්‍රෝපකරණ මගින් කළ යුතුව ඇති බැවින් ටෙන්ඩර් කරුවන් ඔවුන් සතුව ඇති යන්ත්‍රෝපකරණ වල ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය. සුදුසු යන්ත්‍රෝපකරණ ඔවුන් සතුව ඇති බව ඒත්තු ගියහොත් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කිරීම සලකා බලනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මෙම ටෙන්ඩරය ගැන සියලු විස්තර කායර්‍යාලීය වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායර්‍යාලයේදී ලබාගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොටස.

1970 මාර්තු මස 10 වැනි දින,
මාතලේ වාරිමාර්ග කායර්‍යාලයේ දී ය.

3–402—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කළුතර උප කොටස

කොළඹ 5, ජාවත්ත පාරේ, බටහිර කොට්ඨාශයේ ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් කළුතර උප කොට්ඨාශයේ පහත සඳහන් ව්‍යාපාරවලට අවශ්‍ය ලී ගේට්ටු (අදාල උපකරණ සහිතව) සැපයීම සඳහා 1970 අප්‍රේල් මස 8 වැනිදා පෙරවරු 11.00 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීමද එවලේම සිදුකෙරේ.

| වැඩෙහි නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි මුදල<br>රු. | ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. |
|---|---|---|
| (1) බෝකලාව අමුණ | ... 3,250.00 ... | 25.00 |
| (2) ආචාරියා වගුර අමුණ | ... 6,100.00 ... | 25.00 |
| (3) යටවර පනාගොඩ සුළු ගංවතුර වැලැක්වීමේ ව්‍යාපාරය | ... 15,750.00 ... | 25.00 |

2. ඉහත දක්වා ඇති මුදල් ප්‍රමාණයන් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයන් සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, ගොවි කාරක සභා, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කල හැක.

3. 1970 අප්‍රේල් මස 3 වැනිදා සිට 5 වැනිදා දක්වා (දෙදිනම ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී කළුතර/කොළඹ/ගම්පහ/රත්නපුරය/බොල්ගොඩ වැඩ ඒකකය, පානදුර වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වෙන ටෙන්ඩර් කරුවන්හට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දනට කරණ වැඩ සහ එම වැඩවල වටිනාකම දක්වෙන ප්‍රකාශයක් වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර, එම වැඩ සඳහා ඉහත දක්වෙන අයුරු ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාල වල තැන්පත් කල යුතුයි. නැතහොත් නියමිත ටෙන්ඩර් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය 1970 අප්‍රේල් මස 5 වැනිදාට පෙර කාර්යාල වේලාවන් තුලදී යටකී වාරිමාර්ග ඉංජිනේරු වරුන් වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩ පිළිබඳව සැලසුම් හා වෙනත් සියළු විස්තර කාර්යාල වේලාවන් තුලදී කළුතර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

කේ. මයිල්වාගනම්,
වාරිමාර්ග ඉංජිනේරු,
කළුතර උප කොටස.

1970 මාර්තු මස 10 වැනි දින,
කළුතර දී.

2–403—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මිල ගණන් කැඳවීම් පත් අංකය : එල්.කිව්. 697054.

පහත දක්වා ඇති විස්තර අයුරු රෝල්ඩ් ස්ටීල් ජොයින්ට් සැපයීම සඳහා පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අප්‍රේල් 4 වැනි දින පෙරවරු 10.30 තෙක් මිල ගණන් භාරගනු ලැබේ.

අංකය : රෝල්ඩ් ස්ටීල් ජොයින්ට් 60 ක් සැපයීම. වැඩි විස්තර සඳහා දැන්වීමේ ඉංග්‍රීසි අනුවාදය බලන්න.

2. මිල ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "රෝල්ඩ් ස්ටීල් ජොයින්ට් 1970.4.4 දින වසන සඳහා මිල ගණන් පත් අංක එල්. කිව්. 697054" යන්න සඳහන් කර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිල ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිල දැක්විය යුත්තේ :—

අංක : ගබඩාවෙන් ලබා ගැනීමට හෝ පිටරටින් ගෙනැත් දීමට. පිටරටින් බඩු ගෙනත් දෙන්නේ නම් බඩු ගෙනත්දීමට යන කාලය සඳහන් කරන්න. බඩු පිටරටින් ගෙනැත් දෙන්නේ නම් ඒ යන කාල පරිච්ඡේදය මිල ගණන් කැඳවීමේ තීරණය කිරීමේදී විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමාගේ මිල ගණන් භාර ගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සතියක් ඇතුළත එම ද්‍රව්‍ය භාර දීම කළ යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිල කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම මිල කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

2–395—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**රසායනාගාර උපකරණ සැපයීම හා ගෙන ගොස් භාරදීම**

පේරාදෙණියේ කෘෂිම සිංචන නිළධාරි වෙත රසායනාගාර උපකරණ සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා, පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.4.8 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

අභයරත්න බණ්ඩාරනායක,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(සත්ව පාලන හා සෞඛ්‍ය).

2–346—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කායර්‍යාලීය ගොඩනැගිල්ල සෑදීම—කෑගල්ල**

දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කායර්‍යාලය—කෑගල්ලේ ගොඩනැගීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.4.23 වැනි දින පස්වරු 2.30 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර් කරුවන් රු. 75,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.4.8 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡෙදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.
(ආ) රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.3.11 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට, කොළඹ 5.

2–363—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**මහ ඉලුප්පල්ලම ගොවිපල නිවාස සඳහා ගොඩනැගිලි 3 ක් ඉදි කිරීම**

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 23 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 1,50,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.4.8 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡෙදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.
(ආ) රුපියල් 200 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.3.11 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට, කොළඹ 5.

2–362—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

පහත සඳහන් රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා සවස 2.30 දක්වා භාරගනු ලැබේ.

1. (අ) පිරිසිදු එමරි කුඩු අංක 20 ටොන් 1 යි.
   (ආ) පිරිසිදු එමරි කුඩු අංක 18 ටොන් 1 යි.
   (ඇ) පිරිසිදු එමරි කුඩු අංක 16 ටොන් 1 යි.
   (ඈ) මැග්නීසියම් ක්ලෝරයිඩ් ටොන් 1 යි.
   (ඉ) මැග්නීසියම් සිලිකේට් ටොන් 1 යි.

එමරි කුඩු හොණ්ඩර එකේ මලුවල අසුරා තිබිය යුතුයි. මැග්නීසියම් සිලිකේට් හා මග්නීසියම් ක්ලෝරයිඩ් හොණ්ඩර එකේ පීප්පවල තිබිය යුතුය.

මේ සඳහා අවශ්‍ය ආනයන බදු දෙපාර්තමේන්තුව මගින් ගෙවනු ලැබේ. මෙම ද්‍රව්‍ය විවෘත සාමාන්‍ය බලපත්‍රයක් යටතේ ආනයනය කළහැකි වේ.

2. ඉහත සඳහන් රසායනික ද්‍රව්‍ය මරදානේ පියුනීසියා ගුදම්වල තිබෙන මෙම දෙපාර්තමේන්තුවේ ගබඩාවට ගෙනවිත් භාරදිය යුතුය. මෙම ද්‍රව්‍ය ගෙනවිත් භාරදිය හැකි ඉතාමත් කිට්ටුම දිනය ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කළ යුතු අතර, ඉක්මණින් සැපයිය හැකි ටෙන්ඩර්කරුවන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

3. රු. 50 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ බව කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල මෙම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වෙත හෝ කොළඹින් පිටදී ඕනෑම කච්චේරියක මෙම මුදල තැන්පත් කළහැකිය. 1970 අප්‍රේල් 10 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මේ සම්බන්ධයෙන් තවත් යම් තොරතුරක් අවශ්‍ය වුවහොත් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබාගනු මැනවි.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 මාර්තු 20 වන දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 හි,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

3–393—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### විදුලි බල නිෂ්පාදන යන්ත්‍ර ස්පයා සවි කරදීම හා වී තැම්බීමේ ටැංකි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

පහත සඳහන් දෑ සැපයීම හා සවි කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 10 වන සිකුරාදා සවස 2.30 දක්වා භාරගනු ලැබේ.

(අ) මැදවච්චියේ හා කලාවැව රජයේ වී මෝල් වලට කිලවොට් 10 යේ ඩීසල් විදුලි බල නිෂ්පාදන යන්ත්‍ර කට්ටල දෙකක් සැපයීම හා සවිකර දීම.

(ආ) 6′×4′×4′ ප්‍රමාණයේ 3/16″ බාල වානේ තට්ටහඩුවලින් සෑදූ වී තැම්බීමේ වානේ ටැංකි 28 ක්.

(ඇ) ජපානයේ තැනූ හාල් පාහින (පොලිෂර්) "තාති ආර් කේ 15" යන්ත්‍ර සඳහා පාහින ගල් කට්ටල 6 ක්.

2. ඉහත සඳහන් එක් එක් වර්ගය සඳහා රු. 100 බැගින් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබා ගතහැකි ආකෘති පත්‍රවල මෙම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වෙත හෝ කොළඹින් පිටදී ඕනෑම කච්චේරියක මෙම මුදල තැන්පත් කළ හැකිය. 1970 අප්‍රේල් මස 10 වන සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් වර්ග තුන වෙනුවෙන් වෙන වෙනම ආකෘති පත්‍ර නිකුත් කරනවා ඇත.

මේ සම්බන්ධයෙන් තවත් යම් තොරතුරක් අවශ්‍ය වුවහොත් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබාගනු මැනවි.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 මාර්තු 20 වන දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 හි,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

3–394—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## කළුතර කච්චේරිය

### කළුතර දිස්ත්‍රික්කයේ පාරවල් තැනීම

පහත සඳහන් වැඩ සඳහා රුපියල් විසි දාහකට (රු. 20,000) හෝ ඊට වැඩි තැනීම් වැඩ වෙනුවෙන් රජයේ වැඩ, අධ්‍යාපන හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් සහ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති (රු. 20,000) සහ ඊට වැඩි වටිනාකම් ඇති වැඩ සඳහා ඉහත සඳහන් දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) පාලයන්ගොඩ ව්‍යාපාරයට පිවිසෙන පාර තැනීම.

(2) කිතුල්ගොඩ-ලියනගෙ ගුලන පාරේ බෝක්කු තැනීම.

2 ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට, සීල් තබා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නමට එවිය යුතුය.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. නොඑසේ නම්, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4 ටෙන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ වැඩයේ නම ලියා 1970. 4. 10 වනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ටද එම වේලාවේ දී පැමිණ සිටිය හැක.

5. 1970.4.7 වැනි දින දවල් 12 දක්වා කළුතර දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය. නියමිත පෝරමයේ ඉදිරිපත් නොකරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවනු ලබන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කපාගැම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, රු. 20 ක් කළුතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාර ගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුලත අපොහොසත් වුවහොත්, ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත්, හෝ ඒ දැන්වීම ටෙන්ඩර්කරුට ලැබුනාක් මෙන් සළකනු ලැබේ. ගිවිසුම් පත් අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරා ගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් ඔහුට දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස්ය.

11. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමණින්ම රජය කෙරෙහි පවත්නේය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

13. කොන්ත්‍රාත් කරු යටතේ සේවය කරන යම්කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි හැඟී යන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දැක්වූ විට, කොන්ත්‍රාත් කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

14. කොන්ත්‍රාත් කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වයට අනුව එවකට සහ ඉන්පසු මෙම නිලයෙහි අත්සන් කරන ලද අයද අයත් වේ.

15. මෙයට පෙර භාර ගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල්වේලා ඇතිව ඔවුන් දැනට කරගෙන යන වැඩ වල තත්ත්වය දක්වෙන එම වැඩ භාරව සිටින පරිපාලක නිලධාරීන් ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල තැන්පත් කොට ලබා ගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේ දී ඇපකරුවන් අවශ්‍ය වුව හොත් තෝරා ගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමට සමත් විය යුතුය.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත් කරුවෙක් වේනොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුලත් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1970.3.10 දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

3–296—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය

1970-71 වර්ෂයට මයික්‍රෝසෙලුල රබර් ෂීට්ස් සැපයීම සඳහා 1970.4.4 වෙනි දින පෙ. ව. 10 වන තෙක්, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ සැපයුම් කළමනාකරු විසින් මිල ගණන් භාර ගනු ලැබේ. විස්තර ආදිය කාර්යාලයීය වේලාවන් තුල පැමිණ හෝ ලියා ලබා ගත හැක.

සැපයුම් කළමනාකරු,
ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය.

141, පල්ලිය පාර,
මට්ටක්කුලිය, කොළඹ 15.

3–442—70.3.20 දින අංක 14,898 දරණ ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුවට පොරෝණ 200 ක් සැපයීම

පොරෝණ 200 ක් සැපයීම සඳහා කොළඹ 1, තැ. පෙ. 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 23 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

3. කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබා ගන්නා ලද නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. කොළඹ 1, පොලිස් මූලස්ථානයේ පොරෝණ සැම්පල් බලා ගැනීම සඳහා තිබේ.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970. 4. 22 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. තම තැන්පත් මුදල් කොළඹ පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

මේ පිළිබඳ වැඩිමනත් විස්තර පොලිස්පති කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඇල්. ඇම්. ජෝෂප්,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1970 මාර්තු 4 වැනි දින.

3–275/1—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුවට වේවැල් පලිස් 400 ක් සැපයීම

වේවැල් පලිස් 400 ක් සැපයීම සඳහා කොළඹ තැ. පෙ.අංක 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අප්‍රේල් මස 23 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

3. කොළඹ පොලිස් මූලස්ථානයේ, පොලිස්පතිගෙන් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙල කොට පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ඒ බවට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970.4.22 දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. මෙම තැන්පත් මුදල පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

මේ පිළිබඳ වැඩිමනත් විස්තර පොලිස්පති කායඝාලයෙන් ලබාගත හැකිය.

ඇල්. ඇම්. ජෝෂප්,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1970.3.4 වැනි දින.

3–275/2—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිහන් සංස්ථාව

### ෆෙල්ස්පාර් ගල් සැපයීම හා පිහන් ගඩොල් ඇහිරීමට ලී පෙට්ටි සැපයීම

පහත සඳහන් දෑ සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත් 1970.4.4 දින පස්වරු 3 දක්වා ලංකා පිහන් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තැන විසින් භාරගනු ලැබේ. පහත දක්වා ඇති පරිදි මුදල් ගෙවීමෙන් පසු එකී ටෙන්ඩරයන්ට අදාල ටෙන්ඩර් ෆෝර්ම 1970 අප්‍රියෙල් මස 2 වැනි දින දහවල් 12 දක්වා ලබාගත හැක.

1. ෆෙල්ස්පාර් ගල් සැපයීම :—
   - ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල ... රු. 500
   - ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ... රු. 25
2. පිහන් ගඩොල් ඇහිරීමට ලී පෙට්ටි සැපයීම :—
   - ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල ... රු. 100
   - ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ... රු. 10.

සැපයීම් හා [illegible]පු දෙපාර්තමේන්තුව,
ලංකා පිහන් සංස්ථාව,
55, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.
1970 මාර්තු මස 10 වැනි දින,

සැපයීම් කළමණාකරු.

3–414—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදව

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් එක් එක් සැපයීම් ඉදිරියේ පෙන්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

| සැපයීම | | ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය | | ටෙන්ඩර් පත් නිකුත් කරන අවසාන දිනය |
|---|---|---|---|---|
| (1) විදුලි කාර්මික උපකරණ සහ අමතර කොටස් සැපයීම | ... | 1970.4.18 | ... | 1970.4.17 |
| (2) ගොඩනැගිලි උපකරණ සහ අමතර කොටස් සැපයීම | ... | 1970.4.18 | ... | 1970.4.17 |
| (3) ඩිස්ටැම්පර්, ස්නෝසම් සහ පින්තාරු තීන්ත සැපයීම | ... | 1970.4.18 | ... | 1970.4.17 |

2. ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබා ගත හැකි රු. 100 මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම් ඉදිරියෙන් (3) වැනි තීරයෙහි පෙන්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12.00 තෙක් ටෙන්ඩර් ආකෘති නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

1970 මාර්තු 11.

3–439—70.3.20 දින අංක 14,898 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 අප්‍රේල් මස 10 වෙනි දින ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| අ/කන්ඩලම පල්ලේගම මහා විද්‍යාලය | ... | කර්මාන්ත ශාලාව තැනීම. |

සංලක්ෂ්‍යය.—අ=අනුරාධපුර දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 32,000කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රේල් මස 8 දා දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චෙක්පත් මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

3. දෙවෙනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ඔවුන් දෙවෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වෙනි හා 3 වෙනි ඡේදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහු ගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 10 වැනිදා ප. ව. 2.30 ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරණ ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
අනුරාධපුර.

1970 මාර්තු මස 10 වැනිදා,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදීය.

3–339—70.3.20 දින අංක 14,898 දරනා ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ත්‍රිකුණාමලය

**1969-70 වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ටෙන්ඩර්පත් කැඳවීම**

1969-70 වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශය වෙනුවෙන් ටෙන්ඩර් ම විසින් කැඳවනු ලැබේ :—

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය : වාන් ඇල, කන්තලේ, අල්ල, මොරවැව, ගල්මැටියාව, වෙප්පන්කුලම් සහ මංගලවැව.

2. ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කාර්යාලයයේදී, ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970 මාර්තු මස 31 වෙනි දින පෙ. ව. 9.30 දක්වා 1969-70 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

(1) වියන ලද පොල් අතු ජෝඩු (අඩි 7 ක් දික්වූද, අඟල් 14 ක් ෂළල්වූද 1,000 ක මිල)
(2) හුනු බුසල් 1 ක් (එකක්) රාත්තල් 44 කට නොඅඩු බර තිබිය යුතුයි.
(3) තම්බපු හුනු බුසල් 1 ක් (එකක්)
(4) කලුගල් 6″×9″ කියුබ් වලින්
(5) තලාපු කලුගල් 2″ කියුබ් වලින්
(6) තලාපු කලුගල් 1½″ කියුබ් වලින්
(7) තලාපු කලුගල් 1″ කියුබ් වලින්
(8) තලාපු කලුගල් ¾″ කියුබ් වලින්
(9) තලාපු කලුගල් ½″ කියුබ් වලින්
(10) පිලිස්සූ ගඩොල් 1,000 (4½″×2¾″×8½″)
(11) ගඟවැලි කියුබ් වලින්

3. ඉහතින් දැක්වෙන ද්‍රව්‍යයන්ගෙන් අංක 4 සිට 9 දක්වා යටතේ දැක්වෙන ද්‍රව්‍යයන් සඳහා පහත දැක්වෙන ක්‍රමයට මිල ගණන් දැක්විය යුතුය.

(i) ගල්වල ලඟදී අච්චි ගසා කියුබ් ගණනින් භාර දීමට :—

(අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.

(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් ම සපයා.

(ii) ගල්වල සිට වැඩපළට කොන්ත්‍රාත්කරුගේ වාහනවලින් ප්‍රවාහනය කර වැඩ පොලේදී අච්චි ගසා භාර දීමට :—

(අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.

(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් ම සපයා.

4. ඉහතින් දැක්වෙන අංක 1, 2, 3, 10 සහ 11 දැක්වෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් පහත දැක්වෙන පරිදි මිළ ගණන් දැක්විය යුතුයි.

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් පෝරණුව/ගොඩ දමන ස්ථානය අසලදීම භාර දීමට.

(ආ) වැඩ අංශයට ගෙනැවිත් භාර දීමට.

5. පොල්අතු සහ හුනු සැපයීම් සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන්, එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 ක් (පනහක්) බැගින්ද, පොල්අතු සහ හුනු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් පනහ (රු. 50) බැගින්ද, තැන්පත් කර ලබා ගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත හැක. සියලුම තැන්පත් මුදල් මගේ කාර්යාලයයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර එම රිසිට්පත් ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත හැකිය. ටෙන්ඩර්පත් ලබාගැනීමට හැකි අවසාන දිනය 1970 මාර්තු මස 24 වෙනි දින දවල් 12 තෙක් පමණක් බව සලකන්න.

6. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. හුනු සහ පොල්අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකටම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු අතර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි "ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සිල් තබා ඉදිරිපත් කළ යුතුයි.

"ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි,
ඉඩම් සංවර්ධන කාර්යාලය,
ත්‍රිකුණාමලය"

නැතහොත් ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කාර්යාලයයෙහි ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය.

7. 1970 මාර්තු මස 31 වෙනි දින පෙරවරු 10 ට ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් එම කාර්යාලයයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. 1970 මාර්තු මස 31 වෙනි දින පෙරවරු 9.30 ට පසු ලැබෙන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයයි සිතේ නම් ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැකිය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුලත ද්‍රව්‍ය භාර දීමට හැකි විය යුතුයි. එසේ කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත්කරුවකු සේ සලකා ඒ අනුව කටයුතු කරනවා ඇත.

9. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

පී. කනගලිංගම්,
ඉඩම් සංවර්ධන නිලධාරි,
ත්‍රිකුණාමලය.

1970 මාර්තු මස 5 දින,
ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

3–278—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

**පුහුණුමාරු 1 නමැති පුහුණු කරවීමේ බෝට්ටුව විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

"'පුහුණුමාරු 1" නමැති බෝට්ටුව විකිණීම සඳහා, ටෙන්ඩර්පත්‍ර කොළඹ 3, ගාළු මුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියවිලි හා වැඩි විස්තර 70. 4. 8 වැනි දින දහවල් 12 වන තෙක් පහත අත්සන් කර ඇති අයගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම 70. 4. 9 වැනි දින පෙරවරු 10.30 ට අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 200කි.

අයි. ඕ. කේ. පී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3,
1970 මාර්තු 11 වැනි දා.

3–381—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා ප. ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් සෑඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ සවභාවය |
|---|---|---|
| 1. මහ/කදිරේසන් කුමාර ම. වි. | | මා. අ. නි. කායසීලය |
| 2. මහ/දොරණගම වි. | ... | අළුත් වැඩියාව |
| 3. මහ/නාරන්විට වි. | ... | අළුත් වැඩියාව |
| 4. මහ/උඩුවැල්ල වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 5. මහ/පිටකන්ද රේවත වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 6. මහ/ජිනරාජ ම. වි. | ... | කෘෂි විද්‍යා ගොඩනැගිල්ල |
| 7. මහ/දන්තුරේ ධර්මරක්ෂිත ම. වි. | ... | විද්‍යා රසායනාගාරය |
| 8. මහ/මාවිල්මඩ ම. වි. | ... | විද්‍යා රසායනාගාරය |
| 9. මහ/උඩුවෙල ම. වි. | ... | විද්‍යා රසායනාගාරය |
| 10. මහ/අටබාගේ විමලධර්ම ම. වි. | ... | විද්‍යා රසායනාගාරය |
| 11. මහ/ධර්මරාජ ම. වි. | ... | හස්ත කර්මාන්ත ශාලාව. |

සංලක්ෂ්‍යය—මහ = මහනුවර ප්‍රදේශය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත්කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 3 දක්වා රු. 10,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 4 රු. 15,000 හා ඊට වැඩි ගණනකට වැඩ අංක 5 සිට 6 දක්වා රු. 20,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 7 සිට 10 දක්වා රු. 25,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 11 රු. 30,000 සහ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රේල් මස 8 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩුවැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය

සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරී වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා ප.ව. 2.30ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදි ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්‍ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

1970 මාර්තු මස 10 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

3–379—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| මහ/පේරාදෙණිය ගු. වි. | ... | රැස්වීම් ශාලාව ඉදිකිරීම. |

සංලක්‍ෂ්‍යය : මහ = මහනුවර ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 75,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රේල් මස 8 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරී වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 10 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

3–378—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර කච්චේරිය

### ජෝශප් හෝක් ප්‍රණ්‍ය අරමුදලින් ගංවතුරෙන් අනාථ වන අය සඳහා ගෙවල් පහක් සෑදීම

ගංවතුරෙන් අනාථ වන අයවළුන් සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ගලතුර වසමේ රජයට අත්පත් කර ගන්නා ලද බෝතල යාය හේන නම් ඉඩමේ ගෙවල් පහක් සෑදීම සඳහා 1970 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාදා පස්වරු 2 වන තෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. රජයේ දෙපාර්තමේන්තුවල රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි මුදලක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට හෝ ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමූපකාර සමිති හෝ වඩු කර්මාන්ත සමිතිවලට 1970 අප්‍රේල් මස 20 වැනි සඳුදා පෙරවරු 10 වන තෙක් රත්නපුර දිසාපති කාර්යාලයයේ දී ටෙන්ඩර් පෝර්ම් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් දිසාපති කාර්යාලයේ දී මේ වැඩ වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් දිසාපති කාර්යාලයයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. යථෝක්ත සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අනවශ්‍යයය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණකොට අනු පිටපතක් ද සමග ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනය ද

වැඩෙහි නම ද ලියා තිබිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර තැපෑලෙන් නොඑවන්නේ නම් රත්නපුර දිසාපති කාර්යාලයයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

5. 1970 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාදා පස්වරු 2 ට මෙම දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතවරුන්ට හෝ පැමිණ සිටිය හැක.

6. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුයි.

7. වැඩි විස්තර රත්නපුර දිසාපති කාර්යාලයයේ සමාජ සේවා අංශයෙන් ලබාගත හැක.

කුසුමා විලේගොඩ,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970 මාර්තු මස 9 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයයේ දිය.

3–341—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—බණ්ඩාරවෙල

1970 අප්‍රේල් මස 3 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| (1) බ/ඇත්තලපිටිය මහා විද්‍යාලය | විද්‍යාගාර ගොඩනැගිල්ල සහ ජලය සැපයීම |
| (2) බ/ධර්මදූත මහා විද්‍යාලය ... | විද්‍යාගාර ගොඩනැගිල්ල |
| (3) බ/කහගොල්ල මහා විද්‍යාලය | විද්‍යාගාර ගොඩනැගිල්ල |
| (4) බ/කහගොල්ල මහා විද්‍යාලය | කර්මාන්තශාලා ගොඩනැගිල්ල. |

සංක්ෂේපය.—බ = බදුල්ල දිස්ත්‍රික්කය

අවශ්‍ය ලියාපදිංචිය :—

අංක 1—රු. 50,000 හෝ ඊට වැඩි
අංක 2 සහ 3—රු. 45,000 හෝ ඊට වැඩි
අංක 4—රු. 35,000 හෝ ඊට වැඩි.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පරිදි අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රේල් මස 2 වැනිදා දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදි බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධව සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරි/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 3 වැනිදා පෙරවරු 10.30ට බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් බණ්ඩාරවෙල ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. ඊ. ජී. මෙන්ඩිස්,
ඌව ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 10 දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

3–382—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වවුනියා දිස්ත්‍රික්කයේ වෙන්ගල චෙඩ්ඩිකුලමේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය ඉදිකිරීම සඳහාවූ ටෙන්ඩර්පත්, උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, වෙරළ පාර, යාපනය කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. වවුනියා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 47,400කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රුපියල් 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 ක් බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර්පත් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

වී. මානික්කම්,
උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරුතැන
(ගොඩනැගිලි).

උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
වෙරළ පාර,
යාපනය, 1970 මාර්තු 11 වැනි දින.

3–384—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කෝට්ටේ-බෝපේ පාරේ අංක 11/2 බෝක්කුව නැවත සෑදීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 අප්‍රේල් මස 8 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් බාරගනු ලැබේ.

2. කොළඹ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත් වල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපතකින් ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුළුවන.

3. රු. 5,000 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 මාර්තු මස 31 වැනි අඟහරුවාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතැම් වීදියේ පිහිටි මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු, බටහිර කොට්ඨාශය
(මහා මාර්ග).

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 මාර්තු 12.

3–438—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මැදගම, පෙහෙකම් වැඩපල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1970 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1970 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1,
1970.3.13.

3–437/1—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

පුත්තලම් රෝහලේ නව පාලන ගොඩනැගිල්ල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1970 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. පුත්තලමේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විය්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,20,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1970 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ.. පෙ. අංකය 504,
කොළඹ 1,
1970.3.13.

3–437/2—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

පොල්ගහවෙල දිස්ත්‍රික් ආදායම් නිලධාරි කාර්යාලය සහ නිවාස ...නිම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" ...න්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඞාලයේ ...ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්‍ෂ 1970 අප්‍රේල් මස ... වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කුරුණෑගල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ...ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ...ත්‍රියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ ...පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන ...තර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්ත...මේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,20,000 කට නොඅඩු ...ණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ...ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැනපත් මුදල වන ...රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්‍ෂ 1970 අප්‍රේල් ...මස 3 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ ...සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ...ඉල්ලුම්ද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට ...රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පඞාවීමේ ගාස්තුවක් නිකුත් ...කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත ...යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිළධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඞාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්‍ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය : 504,
1970. 3. 13,
කොළඹ 1.

3–734/3—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

(අ)

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ටෙන්ඩර් ප්‍රදානයන් පිළිබඳ දැන්වීම

1969–70 මුදල් වර්ෂය තුළ යුධ හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට හා රාජකීය ලංකා ගුවන් හමුදාවට විවිධ සැපයීම් සහ සේවාවන් සඳහා ගුවන් හමුදාධිපති විසින් කැඳවන ලද ටෙන්ඩර් ප්‍රතිඵල මෙසේ ය :—

| | සැපයීම්/සේවයේ විස්තර | හමුදාව | ස්ථානය | ලැබුණු මුලු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|
| 1. | එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය සැපයීම | ත්‍රිවිධ හමුදාව ... | ත්‍රිකුණාමලය ... | 4 ... | ජේ. පී. ගුණදාස මහතා, අංක 8, මාර්කට්, ත්‍රිකුණාමලය |
| 2. | එම ... | ගුවන් හමුදාව ... | කටුනායක ... | 5 ... | ඩී. ආර්. රාජපක්ෂ සහ සමාගම, 72, එඩින්බරෝ මාර්කට්, කොළඹ 11 |
| 3. | පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... | ත්‍රිවිධ හමුදාව ... | ත්‍රිකුණාමලය ... | 2 ... | ඕ. එල්. ඒ. රහීම් මහතා, 165, මොස්ක් පාර, ත්‍රිකුණාමලය |
| 4. | එම ... | ගුවන් හමුදාව ... | කටුනායක ... | 4 ... | ජී. එම්. එස්. අපොන්සො මහතා, 182ඒ, තල්දූව, මීගමුව (උදෑසන ආහාර පමණි) |
| 5. | එම ... | එම ... | දියතලාව ... | 1 ... | ආමි ඇන්ඩ් නේවි ස්ටෝර්ස්, මහ වීදිය, දියතලාව |
| 6. | මස් වර්ග සැපයීම ... ... | එම ... | කටුනායක ... | 3 ... | ඩී. ආර්. රාජපක්ෂ මහතා, 72, එඩින්බරෝ මාර්කට්, කොළඹ 11 |
| 7. | ගොඩනැගිලි උපකරණ සැපයීම ... | එම ... | කටුනායක ... | 3 ... | ටී. එච්. කරුණාපාල මහතා, 79, මැලිබන් වීදිය, කොළඹ 11 |
| | | | චීනවරාය, දියතලාව | — ... | ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කරන ලදී |
| 8. | නිළ ඇඳුම් හා බැරැක්ක රෙදි ඇපිල්ලීම ... | එම ... | කොළඹ ... | 1 ... | කේ. ආර්. මෙන්ඩිස් මහතා, කඳවුරු ලෝන්ඩ්‍රිය, රා.ලං.ගු.හ., කටුනායක |
| | | | කටුනායක ... | 1 ... | එම |
| | | | චීනවරාය ... | 3 ... | ඩී. රණසිංහ මහතා, උඩුපිල, මිරිස්ස |
| | | | දියතලාව ... | 2 ... | ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු මහතා, බරන්ඩියාවත්ත, වැල්ලම්පිටිය |
| 9. | මාතෘ නිවාස රෙදිපිළි ඇපිල්ලීම ... | එම ... | කටුනායක ... | 1 ... | එම්. මේරි ග්‍රේස් ප්‍රනාන්දු මහත්මිය, අංක 218, තුන්වෙනි කුරණ |
| 10. | පාවහන් අලුත්වැඩියා කිරීම ... ... | එම ... | කටුනායක, චීනවරාය, දියතලාව | 1 ... | එස්. ආර්. එම්. ප්‍රනාන්දු මහතා, කඳවුරු පාවහන් හළ, රා.ලං.ගු.හ., කටුනායක |
| 11. | නිළ ඇඳුම්, ඇතිරිලි සහ කුඩාරම් නැවත සකස් කිරීම | එම ... | කටුනායක ... | 2 ... | ඩී. ඩබ්ලිව්. ජේම්ස් මහතා, කඳවුරු මැහුම් හළ, රා.ලං.ගු.හ., කටුනායක |
| | | | චීනවරාය ... | 1 ... | කේ. කරනේලිස් මහතා, කඳවුරු මැහුම් හළ, රා.ලං.ගු.හ., චීනවරාය |
| | | | දියතලාව ... | 4 ... | එම්. ජී. යාපා මහතා, රත්ජල්ලාව, බණ්ඩාරවෙල |
| 12. | ගුදිරි, කොට්ට සහ කුෂන් නැවත සකස් කිරීම ... | එම ... | කටුනායක, චීනවරාය | 1 ... | කේ. ආර්. මෙන්ඩිස් මහතා, කඳවුරු ලෝන්ඩ්‍රිය, රා.ලං.ගු.හ., කටුනායක |
| | | | දියතලාව ... | — ... | ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කරන ලදී |

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

3–431—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ඌරු පැටවුන් විකිණීම**

**පල්ලෙකැලේ, එළිමහන් සිරකඳවුර**

තොගයට වැඩිවී ඇති මාස දෙකකට වැඩි "ලාජ් වයිට්" වර්ගයේ ඌරු පැටවුන් සහ ඊරි පැටවුන් 50ක් පමණ විකිණීමට ඇත. ගොවිකම් දෙපාර්තමේන්තුවේ මිල ගණන් අනුව මෙම සත්වයින් විකුණනු ලැබේ. සතියේ දිනවල උදේ 8 සිට සවස 2 දක්වාද, පෙර පෝය දිනවල උදේ 8 සිට පෙ. ව. 10 දක්වාද විකුණනු ලැබේ.

ෂෙ. ව. අබේනායක,
බන්ධනාගාර අධිකාරී.

1970 මාර්තු මස 1 වෙනි දින,
පල්ලෙකැලේ, එළිමහන් සිරකඳවුරේදීය.

3–385—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

### පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි පරිහරණය කරන ලද ඇඳුම් හා අනිකුත් බඩු 1970 මාර්තු මස 26 වැනි දින පෙරවරු 10 සිට මාතලේ පොලිස් කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම භාණ්ඩ කාර්යාලය විවෘත වේලාවන් හිදී මාතලේ පොලිස් ගබඩාවේදී පරීක්ෂාකළ හැක. ඉල්ලුම්කරුවන් විසින් ගන්නා බඩු එවෙලේම මුදල් ගෙවා ඉවත් කළ යුතුය.

බයිසිකල් 10යි
බයිසිකල් ලගේජ් කැරියර් 1යි
බයිසිකල් ලාම්පු 1යි
මිනුම් පටි 1යි
ඉබි යතුරු 7යි
මේස මරලෝසු 1යි
ගැලුම් හතරේ තිස් ටින් 27යි
ගැලුම් එකේ තිස් ටින් 22යි
හැවර් සැක් 1යි
කැරම් බෝඩ් 2යි
බයිසිකල් හුලම් පොම්ප 1යි
මේස පන්දු දැල් 1යි
බුෂ්කෝට් බකල් 7යි
පොලිස් රියදුරු තොප්පි 7යි
බොල් බැග්ස් 18යි
පික් කැප්ස් 2යි
කොල්ස්ටර්ස් 2යි
කිට් රග්ස් 11යි
කාකි වැහි කබා 1යි
කාකි කෝට් 17යි
කාකි බුෂ්කෝට් 14යි
කාකි කොට කලිසම් 26යි
කාකි දිග කලිසම් 5යි
බූට් සපත්තු කුට්ටම් 53යි
සපත්තු කුට්ටම් 270යි
හම් පටි 18යි
කොහු ගුදිරි 33යි
කැන්වස් සපත්තු කුට්ටම් 4යි
හම් මලු 2යි
රබර් රේනකෝට් 25යි
නිල් මේස් කුට්ටම් 6යි
ඇල තොප්පි 161යි
මේස ලාම්පු 1යි
බයි ඇලඩින් ලාම්පු 1යි
බයිසිකල් සීට් 1යි
පිඩන ලාම්පු 1යි
බයිසිකල් බෙල් 1යි

ජේ. වී. බී. පෙරේරා,
සහකාර පොලිස් අධිකාරී,
මාතලේ.

පොලිස් කාර්යාලය,
මාතලේ,
1970. 2. 23.

3–372—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

---

### රේගු විකිණීම

මෙහි දැක්වෙන පරිදි පහත සඳහන් බඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසි කරන දිනයෙහි පෙ. ව. 9.30 සිට බඩු පරීක්ෂා කළ හැක. වෙන්දේසි මුදලෙන් හතරෙන් එකක් වැඩිම ඉල්ලුම්කරු විසින් තීන්දු වූවිටම ගෙවිය යුතුයි. සත්දිනක් ඇතුළත ඉතුරු මුදල් ගෙවා බඩු රැගෙන යායුතුයි. සතුවූදයක ඉල්ලුම් පමණක් භාරගනු ලැබේ.

එස්. එම්. ජේ. සේනාරත්න,
යාපනය දිස්ත්‍රික්කයේ සහකාර රේගු අයකැමි.

රේගු කාර්යාලය,
යාපනය,
1970 මාර්තු මස 11 වන දින දී ය.

**1970.4.2 දින පෙ. ව. 10.30 ට යාපනයේ රේගු කාර්යාලයේදී විකුණනු ලබන බඩු :**

1. චීස් ටින් 2 යි.
2. මාළු දැල් මිටි 10 යි. (අළුත්)
3. වින්චෙස්ටර් ටෝච් 120 යි.
4. කරුංකා ගෝනි 11 යි.
5. කෑලි 3 වින්චෙස්ටර් ටෝච් 144 යි.
6. සැකරින් පවුඩර් පෙට්ටි 230 යි.
7. මෙන්තල් කෑට (ක්‍රිස්ටල්) ටින් 1 යි.
8. සැකරින් පෙට්ටි 3 ක්, ටෝච් සහ සාදික්කා.
9. සැකරින් පෙට්ටි 8 ක්, ටෝච් සහ නයිලෝන් නූල්.
10. කරුංකා ගෝනි 40 යි.
11. හයිඩ්‍රෝ සල්පේට් සෝඩා පෙට්ටි 22 යි.
12. බ්‍රැන්ඩි බෝතල් 1 යි.
13. කොඩ්ලිවර් ඔයිල් බෝතල් 1 යි.
14. කාන්තා හවරි.
15. චීන බ්‍රැන්ඩි බෝතල් 1 යි.
16. කුරුඳු පොතු.
17. කොත්තමල්ලි ගෝනි 1 යි.
18. අවුට්බෝට් මෝටර් 1 යි.
19. අවුට්බෝට් මෝටර් 1 යි.
20. කුඩ 4 යි.
21. අවුට්බෝට් මෝටර් 1 යි.
22. කුඩ 8 යි.
23. කුඩ 1 යි.
24. සැකරින් ටින් 60 යි.
25. කරාබු නැටි ගෝනි 25 යි.
26. පොල් තෙල්.
27. සාදික්කා තොගයක්.
28. කරාබු නැටි තොගයක්.

**1970.4.3 දින පෙ. ව. 10.30 ට වැල්වැටිතුරේ රේගුවේදී විකුණනු ලබන බඩු :**

1. කට්ටමරන් කිපයක්

3–427—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### නිවැරදි කිරීමයි

අංක 14,895 හා 1970.2.27 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ විවිධ දැන්වීම් යටතේ පළවූ මාගේ සිංහල දැන්වීමෙහි, දෙවන පේලියේ සඳහන් වූ 1970.1.5 දිනය, 1970.2.5 යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

අමරවංශ දේවරාජ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ හා
පොත් හා ප්‍රවෘත්ති පත්‍ර රෙජිස්ත්‍රාර්.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
7, ඊඩී මාවත,
කොළඹ 7.

3–349—70.3.20 දින අංක 14,898 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් විනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම යැවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු | ... 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... 70. 2.27 සිකුරාද | දහවල් 12.0 |
| | 70. 3.13 සිකුරාද | ... 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70. 3.20 සිකුරාද | ... 70. 3.13 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | ... 70. 4. 3 සිකුරාද | ... 70. 3.25 බදාදා | ප.ව. 3.30 |
| | 70. 4.10 සිකුරාද | ... 70. 4. 3 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 4.17 සිකුරාද | ... 70. 4. 8 බදාදා | ප.ව. 3.30 |
| | 70. 4.24 සිකුරාද | ... 70. 4.17 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| මැයි | ... 70. 5. 8 සිකුරාද | ... 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70. 5.15 සිකුරාද | ... 70. 5. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 5.22 සිකුරාද | ... 70. 5.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 5.29 සිකුරාද | ... 70. 5.22 සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි | ... 70. 6. 5 සිකුරාද | ... 70. 5.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... 70. 6. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි